# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2485/57 - 2026 අප්‍රේල් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2026.04.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ කයිට්ස් ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොටගෙන කයිට්ස් ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කයිට්ස් ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ යේසුදාසන් මිල්ටන් ජෙලක්ස්ටන් මහතා අයත් වන්නා වූ ජනනායක තමිල් තේසිය කූට්ටනි නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කයිට්ස් ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සිවානන්දන් අජන්දන් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කයිට්ස් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, රාජේන්ද්‍රා සසීලන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සිවානන්දන් අජන්දන් මහතා, කයිට්ස් ප්‍රාදේශීය සභාවේ, තෝරා එවා ඇති සභිකයකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. සසීලන්,**
තේරීම්භාර නිලධාරි,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

EOG 04 - 0168

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ**
**වාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොටගෙන වාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ වාවකච්චේරිය ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයකු ලෙස පත් වූ සෙල්වරත්තිනම් ආනන්දකුමාර් මහතා අයත් වන්නා වූ අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම වාවකච්චේරිය ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වඩිවේල් මුරුකවේල් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

වාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, රාජේන්ද්‍රා, සසීලන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් වඩිවේල් මුරුකවේල් මහතා වාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. සසීලන්,**
තේරීම්භාර නිලධාරි,
වාවකච්චේරිය ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

EOG 04 - 0169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.